# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1833/23 - 2013 ඔක්තෝබර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

තුරෙයි පිරතීපන් නම් වූ සභිකයා අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 ජූලි මස 23 වැනි දින වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් ඉන්තිරරාසා තුසීකරන් මහතා ඒ පුරප්පාඩුව ඇති වූ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 17 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

11 - 262